**2026.02.25** **චක්‍රලේඛ අංක : 17/2026**

**සියළුම දිසා කොමසාරිස්වරුන් හා සහාය දිසා කොමසාරිස් (පුහුණු) වෙත,**

**පෝතක බාලදක්ෂ නායක – ලී පදක්කම් පුහුණුව**

**93 වන IV අදියර පෝතක බාලදක්ෂ නායක/නායිකා උසස් පාඨමාලාව**
**2026 අප්‍රියෙල් 21 – 26**
**මීරිගම ලී දසනායක බාලදක්ෂ පුහුණු මධ්‍යස්ථානයේ දී**

**පෝතක බාලදක්ෂ** අංශයේ III අදියර සාර්ථක ව නිම කළ, **පෝතක බාලදක්ෂ** නායක/නායිකාවන් සඳහා **පෝතක බාලදක්ෂ** අංශයේ IV අදියර උසස් පාඨමාලාව **2026** අප්‍රියෙල් මස **21** වන අඟහරුවාදා සිට **26** වන ඉරිදා දක්වා මීරිගම ලී දසනායක බාලදක්ෂ පුහුණු මධ්‍යස්ථානයේ දී පුහුණුකිරිමේ නායිකා කේ භාරති මහත්මිය ගේ අධ්‍යක්ෂණය යටතේ පැවැත්වීමට කටයුතු සංවිධානය කර ඇත.

ඒ සඳහා මේ සමග අමුණා ඇති අයදුම් පත්‍රය නිසි ලෙස සම්පූර්ණ කර, **2026 මාර්තු මස 13 වන දිනට ප්‍රථම** ජාතික බාලදක්ෂ මූලස්ථානයට යොමු කරවීමට කටයුතු කරන්න.

සම්මුඛ පරීක්ෂණය **2026** මාර්තු මස **18** වන බදාදා දින පෙ.ව **10.00** ට ජාතික බාලදක්ෂ මූලස්ථානයේ දී පැවැත්වේ.

- පාඨමාලා ගාස්තුව **:** රු. **5,500**/- කි.

- **IV අදියර පෝතක බාලදක්ෂ නායක/නායිකා උසස් පාඨමාලාවට සහභාගීවීමට තිබිය යුතු සුදුසුකම්**

    i. III අදියර සාර්ථකව නිමා කර තිබීම.

    ii. **2025** වසර සඳහා අධිකාරි පත්‍රයක් ලබා තිබීම හෝ **2025** වසරට නවීකරණය කර තිබීම.

    iii. මීට පෙර වෙනත් අංශයකින් IV අදියර පාඨමාලාවක් හදාරා ඇත්නම්, එම අංශයෙන් ලී පදක්කම දිනා, එම අංශයට වසර **02** ක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතු ය.

- **සම්මුඛ පරීක්ෂණයට පැමිණිමේදී රැගෙන ආයුතු දේ :-**

    1. අනන්‍යතාවය තහවුරු කිරිමට ජාතික හැඳුනුම්පත, රියදුරු බලපත්‍රය හෝ විදේශ ගමන් බලපත්‍රය
    2. අධිකාරි පත්‍රයේ පිටපතක්
    3. බාලදක්ෂ නායක ප්‍රගති පුහුණු වාර්තාව (1 – 5 පොත) සම්පූර්ණ කර පැමිණීම.
    4. **2** වන අදියර සහතිකය (**2** වන අදියරින් පසු **2026** අප්‍රියෙල් මස **21** වන දිනට මාස **06** ක සේවා කාලයක් තිබිය යුතු ය.)

5. දින **05** ක් ප්‍රායෝගික ව නේවාසික පුහුණුව ලැබීමට සුදුසු සෞඛ්‍ය තත්වයේ සිටින බවට වෛද්‍ය සහතිකයක් ඉදිරිපත් කළ යුතු ය.

6. සම්මුඛ පරීක්ෂණයෙන් සමත් වුවහොත් පාඨමාලා ගාස්තු ගෙවීමට මුදල් රැගෙන ආ යුතු ය.

➢ **සැලකිය යුතු කරුණු :**

❖ අධිකාරි පත්‍රයක් නොමැති කිසිවකු පාඨමාලාවට ඇතුලත් නොකෙරේ.

❖ පාඨමාලාවට ඇතුළත් කිරීමෙන් පසු දැනුම් දීමක් කර, සහභාගි නොවුවහොත් පමණක් ගෙවූ මුදලින් 75% ක් ආපසු ගෙවනු ලැබේ.

ඉදිරි කටයුතු සංවිධානය කිරීමේ පහසුව උදෙසා නියමිත කාලය තුළ දී අයදුම් පත්‍ර යොමු කරවීමට කටයුතු කරන ලෙස කාරුණික ව දැනුම් දෙමු.

ස්තූතියි.

මෙයට,
බාලදක්ෂ සේවයේ නියුතු,

**කර්නල් පද්මලාල් පෙරේරා**
ජාතික පුහුණු කිරීමේ කොමසාරිස්

**නිතීඥ මනෝජ් නානායක්කාර**
ප්‍රධාන කොමසාරිස්

පිටපත - 1. ජාතික බාලදක්ෂ මූලස්ථානයේ සියළුම කොමසාරිස්වරුන්
2. සභාපති/විධායක කමිටු සභාපති/ගරු ලේකම්/ගරු භාණ්ඩාගාරික - ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමය